# 2019 පෙබරවාරි මාසය සඳහා අයැදීමට සහ මැදිහත් වීමට අත්වැලක්

## "මම වහාම එමි. ඔබේ කිරුළ කිසිවකු පැහැර නොගන්නා ලෙස, ඔබ සතු දෙය තදින් අල්ලා ගන්න." (එළිදරව්ව 3:11)

අපගේ මරණ මොහොත කිනම් මොහොතකදැයි අපි නොදනිමු. එසේම ජේසු ක්‍රිස්තුන් වහන්සේ අප වෙත විරාජමානව පැමිණීමේ මොහොතද අපි නොදනිමු. එසේ නම් අප කරන කියන දේ ගැන නිතරම අවදියෙන් සිටිය යුතුය. ආත්මික දේ පසෙක ලා ලෞකික දේ ගැන ඇලී ගැලී ජීවත් වුවහොත් නියමිත මොහොතේදී පසුතැවීමට සහ කළකිරීමට අපට සිදුවනු ඇත. එසේනම් ප්‍රසාද ස්නාපන සක්‍රමේන්තුව තුළින් දෙවියන් වහන්සේ අපට ලබා දුන් **දේව පුත්‍රභාවය නමැති කිරුළ** යක්ෂයා, ලෝකයා, මාංශයට පැහැර ගැනීමට ඉඩ නොදිය යුතුය.

එසේ නම් අයැදීමේ සේවකයන් වශයෙන් අපි නිරන්තරයෙන්ම ශුද්ධාත්මයාණන්ට අවදි වී, දේව කැමැත්ත නිතර විමසමින් අන්ධකාරයේ ක්‍රියාවලට හසු නොවී ආලෝකයේ ජීවත් වෙමු. එමෙන්ම මෙම මාසය පුරාවටම **දේව පුත්‍රභාවයේ උරුමය නමැති කිරුළ** පැලඳ ගත් සැම කිතුනුවෙකුටම තම කිරුළ පැළඳගෙන යක්ෂයා, ලෝකයා, මාංශය නමැති ත්‍රිවිධ සතුරන්ගෙන් ඔවුන් ආරක්ෂා කර දෙන්න කියා විශේෂයෙන් මේ මාසය පුරාවටම පුබුදු ජනතාව සහ සමස්ථ කිතුනු ජනතාව වෙනුවෙන් අයැදිමු, මැදිහත් වෙමු.

> **"දෙවියන් වහන්සේට ප්‍රේම කරන්නන් හට**
> **ඔවුන් වහන්සේ සූදානම් කර ඇත්තේ**
> **කිසිවෙකු කවදාවත් ඇසින් නුදුටු**
> **කනින් නොඇසූ**
> **සිතින් නොසිතූ දෙයකි"** (1 කොරෙන්ති 2:9)

පළමු සතිය - දිව්‍යමය කියවීම: එළිදරව්ව 3:7-13
අයැදීමට විශේෂ යොමුව:
ස්වාමි තාත්තා වෙනුවෙන් (විනාඩි 10 ක් පමණ)
(පෙබරවාරි 02 ස්වාමි තාත්තාගේ පූජාත්තර සංවත්සරය)

වෙනත් අයැදීම්:
* දිවැසි එකතුව, සහයක එකතුව, සුසමථ එකතුව ඇතුළු පුබුදුව තුළ වගකීම් ගන්නා සියළු දෙනා වෙනුවෙන්
* මාසයේ පළමු ඉරුදින පවත්වන සාංඝික පවුල් දිනය වෙනුවෙන්
* සබැඳි, සුබැඳි, සුරැඳි, සුමැදි සංඝයන් සහ පුබුදුව තුළ සරල චාම් සුදු මුදු විවාහ කළ පවුල් සහ ඔවුන්ගේ දරුවන් වෙනුවෙන්
* මුල් කාලයේ ප්‍රමුඛතාවයක් ලෙස පැවතුනු, බ්‍රහස්පතින්දා දිනවල පුබුදු පවුල්වල පැවති පවුල් යාගය නැවතත් ඇරඹෙන ලෙස
* ප්‍රශංසා එකතු භාරව සහ ශ්‍රාවක සංඝ බාරව සිටින අය වෙනුවෙන්
* අපගේ දේශය වෙනුවෙන්
* වෙනත් අයැදීම් ……

දෙවන සතිය - දිව්‍යමය කියවීම - ජූද් 1:17-25
අයැදීමට විශේෂ යොමුව:
විවිධ වසංගත රෝග, පිළිකා, වකුගඩු රෝග, හෘදයාබාධයන් ඇති සහ මානසික ආබාධවලින් පෙළෙන සියළු දෙනා වෙනුවෙන් (විනාඩි 10 ක් පමණ)

වෙනත් අයැදීම්:
* පෙබරවාරි 9-10 දිනවල ප්‍රශංසාරාමයේ පැවැත්වෙන ඇතුළාන්ත සුව සම්මේලනයට සහභාගි වන සියළු දෙනා සහ උපස්ථාන කණ්ඩායම වෙනුවෙන්
* මත්පැන්, මත්ද්‍රව්‍ය ඇතුළු විවිධ අපචාරයන්ට යොමුවූ බාල - තරුණ - මහළු සියලුදෙනා වෙනුවෙන් සහ ඔවුන්ගේ පවුල් වෙනුවෙන්
* පෙබරවාරි 15 සිට 18 දක්වා ප්‍රශංසාරාමයේ පැවැත්වෙන ස්වඅනාවරණ සම්මේලනයට සහභාගි වන සියලු දෙනා සහ වචනයේ සේවකයා වෙනුවෙන්
* විදේශ රටවල පුබුදු සංඝයන් වෙනුවෙන්
* ප්‍රශංසාරාමය, ධර්මාරාමය, රම්‍යාරාමය ඇතුළු පුබුදු මධ්‍යස්ථාන සහ ක්‍රිස්තු දූත සේවා ස්ථානවල පදිංචි අය සහ ඒ ඒ ස්ථානවල කෙරෙන සේවාවන් වෙනුවෙන්
* වෙනත් අයැදීම් ….

තෙවන සතිය - දිව්‍යමය කියවීම: එපීස 6:10-18
අයැදීමට විශේෂ යොමුව:

පුබුදුව තුළ මෙම වසර ජාතික තරුණ වසර සහ කලා වසර වෙනුවෙන් නම් කර ඇති බැවින් ඒ ඒ ක්ෂේත්‍රයන් තුළ ප්‍රබෝධයක් ඇතිවූ සඳහා (විනාඩි 20 ක් පමණ)

වෙනත් අයැදීම්:
* පුබුදු මුද්‍රණාලය සහ සුදතුම් ගමන සඟරාවට ලිපි සපයන ලේඛක ලේඛිකාවන්, සුදතුම් ගමන සඟරාව බෙදා හරින්නන් සහ කියවන අය වෙනුවෙන්
* දරු ප්‍රසූතියට ළංවී ඇති අම්මලා සහ දරුවන් බලාපොරොත්තුවෙන් සිටින යුවල් වෙනුවෙන්
* මත්පැන්, මත්ද්‍රව්‍ය ඇතුළු විවිධාකාර අපචාරයන්ට යොමුවූ සියලුදෙනා වෙනුවෙන්
* මහළු මඩම්වල සහ ළමා නිවාසවල ජීවත් වන අසරණ අය සහ ඔවුන්ට උපස්ථාන කරන සියළු දෙනා වෙනුවෙන්.
* වෙනත් අයැදීම් .....

සතරවන සතිය - දිව්‍යමය කියවීම: 2 තිමෝති 4:1-8
අයැදීමට විශේෂ යොමුව:

දේශය වෙනුවෙන් (විනාඩි 20 ක් පමණ)

වෙනත් අයැදීම්:
* අයැදීම් සහ මැදිහත් යාච්ඤා සේවාවට සම්බන්ධ සියලු දෙනා සහ අයැදීම් සහයක එකතුව වෙනුවෙන්
* වෙනත් අයැදීම්....

**"නිතරම ප්‍රීති වන්න. නොකඩවා යාච්ඤා කරන්න.**
**සියල්ලේදී ස්තූති දෙන්න.**
**කිතුනුවන් වශයෙන් දෙවියන් වහන්සේ ඔබගෙන්**
**බලාපොරොත්තු වන්නේ මෙය වේ."**

(1 තෙසලෝනික 5:16)

- අයැදීමේ සහ මැදිහත් වීමේ සේවාව -

****************************